රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | **COMBINED SERVICES DIVISION**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන தொலைபேசி: **(94) 011- 2694560** Telephone
ෆැක්ස් தொலைநகல்: **(94) 011- 2692254** Fax
ඊ-මේල් மின்னஞ்சல்: **dgcs@pubad.gov.lk** E-mail
වෙබ් අඩවිය இணையத்தளம்: **www.pubad.gov.lk** Web Site

මගේ අංකය எனது இல My No } CS/DOS/Policy/03/05/(II)
ඔබේ අංකය உமது இல Your No }
දිනය திகதி Date } 2023.01.05

අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කරන ලද නිලධාරීන්ගේ ආයතනික කටයුතු සම්බන්ධවයි.</u>**

අංක 1774/31 දරණ 2012.09.07 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් සංශෝධිත අංක 1745/11 හා 2012 පෙබරවාරි මස 14 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත්කළ සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවෙහි 14වන ඡේදය ප්‍රකාරව රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා ලබා දීමේ රජයේ ප්‍රතිපත්තිය මත විවිධ තනතුරු නාම යටතේ 2011.08.01 දිනට පෙර රාජ්‍ය සේවයට බඳවා ගනු ලැබ MN4-2006(A) වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කිරීම සිදු කරනු ලබයි.

02. සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණයවීමට මනාපය පළකර, පසුව රාජ්‍ය සේවයෙන්/පළාත් රාජ්‍ය සේවයෙන් වෙනත් තනතුරකට මුදාහැර ඇති නිලධාරීන්, සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කළ යුතු බවත්, මුදාහැරීමට පෙර උසස්වීමට අදාළ සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබේනම් අදාළ උසස්වීම් ලබා දී සංවර්ධන නිලධාරී සේවයෙන් මුදාහැරිය යුතු බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් දන්වා ඇත.

03. එමනිසා සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කර ඇති නිලධාරීන් පසුව රාජ්‍ය සේවයේ වෙනත් සේවාවකට හෝ තනතුරකට පත්කර ඇති අවස්ථාවකදී එම නිලධාරීන් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කිරීමෙන් අනතුරුව සංවර්ධන නිලධාරී සේවයෙන් ස්ථිරව මුදාහැරීමට කටයුතු කළ යුතු වේ. එසේ මුදාහරිනු ලබන දිනට සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවේ උසස්වීම් ලබාගැනීමට අදාළ සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබේනම් අදාළ පරිදි උසස්වීම් ලබා දීමට ද කටයුතු කළ යුතුය.

උදා:- 2005.08.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සමාජ සංවර්ධන සහකාර තනතුරකට පත්වීම් ලද නිලධාරියෙකු එදිනම එම දෙපාර්තමේන්තුවේ වැඩභාර ගෙන ඇත. පසුව නිලධාරියා 2011.08.01 දිනට ක්‍රියාත්මක වන පරිදි සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීම සඳහා මනාපය පළ කර ඇති අතර 2018.06.06 දිනැතිව සමාජ සේවා දෙපාර්තුමේන්තුවේ සමාජ සේවා නිලධාරී II ශ්‍රේණියේ තනතුරකට පත්කර ඇත.

මෙවැනි නිලධාරියෙකු 2011.08.01 දිනැතිව සංවර්ධන නිලධාරී සේවයේ III ට අන්තර්ග්‍රහණය කර, සේවා ව්‍යවස්ථාවේ II ශ්‍රේණියට උසස්වීමට අදාළ සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබේ නම් 2015.08.15 දිනට II ශ්‍රේණියට උසස් කළ යුතුය. අනතුරුව සංවර්ධන නිලධාරී සේවයෙන් 2018.06.06 දින සිට මුදාහැරීමට කටයුතු කළ යුතුය.

04. සංවර්ධන නිලධාරී සේවයෙන් මුදාහරින ලද රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ වෙනත් තනතුරකට මුදාහරින ලද නිලධාරීන්ගේ නව තනතුරේ වැටුප් සකස් කිරීම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි 05/2017 අනුව සිදු කළ යුතු බව කාරුණිකව දන්වා සිටින අතර සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කරනු ලැබ ඔබ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/කාර්යාලයේ සේවයේ නියුතුව සිට පසුව වෙනත් තනතුරක පත්වීම් ලැබ මුදාහැර ඇති නිලධාරීන් වේ නම් එම නිලධාරීන් දැනුවත් කොට සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කිරීමට හා නව තනතුරට විධිමත්ව මුදාහැරීමට අවශ්‍ය ලිපිලේඛන මා වෙත යොමු කරන මෙන් කාරුණිකව දන්වමි.

එස්. ආලෝකබණ්ඩාර<br>
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්